# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2049/11 - 2017 දෙසැම්බර් මස 11 වැනි සඳුදා - 2017.12.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත**

3 වන වගන්තිය යටතේ නියමය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙහි I වන උපලේඛනයේ I සහ II වැනි තීරුවේ දක්වා ඇති දැනටමත් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මගින් නිශ්චිත මායිම් හා ඉම් සලකුණු නිශ්චිතවම දක්වා ඇති මහා නගර සභා 05ක්, නගර සභා 07 සහ ප්‍රාදේශීය සභා 07 කින් සමන්විතව ඇත්තා වූ ප්‍රදේශය මහා කොළඹ සංවර්ධනය ප්‍රදේශයේ හර ප්‍රදේශය ලෙස නම් කොට සංවර්ධනය කිරීම සුදුසු බැව් මගේ මතය වන හෙයින්, එම ප්‍රදේශ එම වගන්තියේ කාර්යය සඳහා මහා කොළඹ සංවර්ධන හර ප්‍රදේශය ලෙස විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

පාඨලී චම්පික රණවක,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 08 වැනි දින,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 සහ18 වන මහල,
''සුහුරුපාය'',
''ශ්‍රී සුභූතිපුර පාර'',
බත්තරමුල්ල.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය I

### *මහා කොළඹ සංවර්ධන හර ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම*

*I වැනි තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රවලට අනුව, 1947 අංක. 29 දරන මහා නගර සභා ආඥා පනත යටතේ සීමා මායිම් ප්‍රකාශයට පත් කර ඇති, කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය, දෙහිවල-ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය, මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා බල ප්‍රදේශය, කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශය ද,

1939 අංක. 61 දරන නගර සභා ආඥා පනත යටතේ මායිම් සීමා ප්‍රකාශයට පත් කරන ලද, මහරගම නගර සභා බල ප්‍රදේශය, කොළොන්නාව නගර සභා බල ප්‍රදේශය, කැස්බෑව නගර සභා බල ප්‍රදේශය, බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය, ජා-ඇල නගර සභා බල ප්‍රදේශය, වත්තල-මාබෝලේ නගර සභා බල ප්‍රදේශය, පෑලියගොඩ නගර සභා බලප්‍රදේශය ද,

1987 අංක. 15 දරන ප්‍රදේශීය සභා පනත යටතේ මායිම් සීමා ප්‍රකාශයට පත් කරන ලද, මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, බියගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, වත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, ජා-ඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, කැළණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, කොටිකාවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, හෝමාගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය,

යන පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්ගෙන් සමන්විත මෙහි II වැනි තීරුවෙන් විස්තර වන්නා වූ පළාත් පාලන ආයතන 19 කින් සමන්විත මුළු මහත් භූමි ප්‍රමාණය වේ.

*II වැනි තීරුව*

- 1978.08.10 හා ගැසට් අංක. 329/8 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රය මගින් ප්‍රකාශිත සීමා මායිම් තුළ පිහිටි කොළඹ මහා නගර සභා බලප්‍රදේශය.
- 1978.08.10 හා ගැසට් අංක. 329/8 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රය මගින් ප්‍රකාශිත සීමා මායිම් තුළ පිහිටි දෙහිවල-ගල්කිස්ස මහා නගර සභා බලප්‍රදේශය.
- 1997.01.08 හා ගැසට් අංක. 957/13 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රය මගින් ප්‍රකාශිත සීමා මායිම් තුළ පිහිටි මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය.
- 1996.09.17 හා ගැසට් අංක. 941/9 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රය මගින් ප්‍රකාශිත සීමා මායිම් තුළ පිහිටි ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා බලප්‍රදේශය.
- 2010.02.02 හා ගැසට් අංක. 1639/11 *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත සීමා මායිම් තුළ පිහිටි කඩුවෙල මහා නගර සභා බලප්‍රදේශය.
- 2002.01.10 දිනැති අංක. 1218/35 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රය මගින් ප්‍රකාශිත සීමා මායිම් තුළ පිහිටි මහරගම නගර සභා බලප්‍රදේශය.
- 1978.08.10 දිනැති අංක. 329/8 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත සීමා මායිම් තුළ පිහිටි කොළොන්නාව නගර සභා බලප්‍රදේශය.
- 2006.01.04 දිනැති අංක. 1426/15 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රය මගින් ප්‍රකාශිත මායිම් තුළ පිහිටි කැස්බෑව නගර සභා බලප්‍රදේශය.
- 2006.01.04 දිනැති අංක. 1426/15 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රය මගින් ප්‍රකාශිත සීමා මායිම් තුළ පිහිටි බොරලැස්ගමුව නගර සභා බලප්‍රදේශය.
- 1983.02.09 දිනැති අංක. 231/13 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රය මගින් ප්‍රකාශිත සීමා මායිම් තුළ පිහිටි ජා - ඇල නගර සභා බලප්‍රදේශය.
- 1983.02.09 දිනැති අංක. 231/13 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රය මගින් ප්‍රකාශිත සීමා මායිම් තුළ පිහිටි වත්තල-මාබෝලේ නගර සභා බලප්‍රදේශය.
- 1983.02.09 දිනැති අංක. 231/13 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රය මගින් ප්‍රකාශිත සීමා මායිම් තුළ පිහිටි පෑලියගොඩ නගර සභා බලප්‍රදේශය.

උපලේඛනය I (සම්බන්ධිතයි)

**මහා කොළඹ සංවර්ධන හර ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම.**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| | - 1987.05.12 දිනැති ගැසට් අංක. 453/6 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද සීමා මායිම් තුළ පිහිටි මහර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය. |
| | - 1995.04.21 දිනැති ගැසට් අංක. 867/21 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද සීමා මායිම් තුළ පිහිටි බියගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය. |
| | - 1987.05.12 දිනැති අංක. 453/6 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද සීමා මායිම් තුළ පිහිටි වත්තල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය. |
| | - 1987.05.12 දිනැති අංක. 453/6 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද සීමා මායිම් තුළ පිහිටි ජා-ඇල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය. |
| | - 1987.05.12 දිනැති අංක. 453/6 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද සීමා මායිම් තුළ පිහිටි කැළණිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශය. |
| | - 1987.05.12 දිනැති අංක. 453/5 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද සීමා මායිම් තුළ පිහිටි කොට්කාවත්ත ප්‍රාදේශීය සභා බලප්‍රදේශය. |
| | - 1987.05.12 දිනැති අංක. 453/5 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද සීමා මායිම් තුළ පිහිටි හෝමාගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය. |

12 - 884

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.